විද්‍යාලය :- තෙප්පනාව කුමාර මහා විද්‍යාලය

සිංහල භාෂාව හා සාහිත්‍යය :- 12 ශ්‍රේණිය පැවරුම්

පුරාතන ගද්‍ය සාහිත්‍යය :- චන්දකින්නර ජාතකය (පන්සිය පනස් ජාතක පොත )

විෂය භාර ගුරු :- ඕ.එම්.එන්.කරුණාරත්න

**01.පහත ඒවායේ අවස්ථා සම්බන්ධය දක්වන්න?**

1. "නුඹ වහන්සේ එක් වේලේ වළඳති යනු අසා තුමු ද එක භක්තයෙන් යැපෙන්නාහ".
2. "තී හඬන්නට කාරණා කවරේද"
3. "මේ කිඳුරා විද දිවි තොර කොට මැ හා සමග වාසය කෙළෙම්නම් යහපතැ"
4. "මාගේ ස්වාමි පුරුෂයාණන් විදිනා ලද්දේය"

**02.පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න?**

තවද නුඹ වහන්සේ බිම වැද හොති යනු අසා තුමු ද බිම සයනය කරන්නාහ.තවද නුඹ වහන්සේ මහණ බව අසා තෙසු රජ දරුවන් එවූ පඬුරු නොගෙන නුඹ වහන්සේ කෙරෙහි ස්නේහයෙන් වැන්දඹුව ජීවත් වූයේ ඉතා ආශ්චර්යයැයි සිතම්.ස්වාමි දරුවාණෙනි ,යනාදීන් යේළනියන්ගේ ගුණ බොහෝ කොට වර්ණනා කළ සේක.එපවත් අසා බුදුහු මහරජ යම්බඳු මැ දැන් වැන්දඹුව කෙළවර අත් බැව්හි මාකෙරෙහි ස්නේහයෙන් ක්ලේශවශග නොවී අනුන් ප්‍රාර්ථනා නොකල බව **ආශ්චර්ය** නොවෙයි. පෙර ගිය දවස තිරිසන් යෝනියෙහි ඉපිද පවා මා කෙරෙහි ස්නේහයෙන් ප්‍රාර්ථනා නොකළවා දැයි ධරම දේශනා කොට මුබ මාත්‍රයක් දක්වා වැඩ හුන් කල්හි ඒ භවාන්තර ප්‍රවෘත්ති ඇසීමෙහි කුසල සිත් ඇති පිය රජහු විසින් ආරාධිත වූ බුදු රජහු සාගර ජලයෙන් සැඟවී තුබූ මෙර පත්ලෙහි සත්රුවන් වැල්ල තෙල වේදැයි ගෙන හැර පානා කලක් පරිද්දෙන් භවයෙන් **පිළිසන්** වූ ජාතක කථාව ගෙන හැර දක්වන සේක්.

1. ඉරි ඇඳි පද සඳහා අර්ථ විවරණ සපයන්න ?
2. භවාන්තර හා සත්රුවන් යන පද සඳහා ව්‍යාකරණ විභාග දක්වන්න ?
3. "තුමූද බිම සයනය කරන්නාහ " යන්නෙහි අර්ථය කුමක්ද ?
4. මෙහි ආශ්චර්යයට හේතු වූ කරුනක් ලෙස දැක්වෙන්නේ කුමක්ද ?